# උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය

# වයඹ විශ්වවිද්‍යාල නගර ප්‍රදේශ සංවර්ධන ව්‍යාපෘතිය

සවුදි අරාබි රජය විසින් අරමුදල් සපයනු ලබන හා උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන වයඹ විශ්වවිද්‍යාල නගර ප්‍රදේශ සංවර්ධන ව්‍යාපෘතියේ පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලංකාවේ සුදුසුකම්ලත් පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම ව්‍යාපෘතිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 01/ 2019 දරන 2019.03.05 දිනැති චක්‍රලේඛයේ සහ අදාළ සංශෝධනවල විධිවිධානවලට අනුකූලව ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් ලෙස ස්ථාපනය කොට ඇති අතර, ඇස්තමේන්තුගත පිරිවැයේ මුළු වටිනාකම දළ වශයෙන් රු. මිලියන 4,077 වේ.

| තනතුර | තනතුරු සංඛ්‍යාව | වැටුප් මට්ටම |
|---|---|---|
| ව්‍යාපෘති ගණකාධිකාරී | 01 | PS4 |
| අභ්‍යන්තර විගණක | 01 | PS4 |
| ව්‍යාපෘති ලේකම් | 01 | PS6 |
| කළමනාකරණ සහායක | 02 | අංක 01/2019 දරන කළමනාකරණ චක්‍රලේඛය පරිදි |
| ප්‍රසම්පාදන සහායක | 01 | |

ඉහත තනතුරුවලට බඳවා ගැනීම සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් හා පොදු කොන්දේසි පහත දක්වා ඇති පරිදි වේ.

**එක් එක් තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම්**

**1. ව්‍යාපෘති ගණකාධිකාරී, අභ්‍යන්තර විගණක (PS4)**

**අවම සුදුසුකම් හා පළපුරුද්ද පහත (1) හෝ (2)**

(1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම

හෝ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අදාළ ක්ෂේත්‍රයේ උපාධියකට සමාන සුදුසුකමක් ලෙස පිළිගනු ලබන සුදුසුකමක්

හෝ

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක් වෙතින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය/ සමාන වෘත්තීය සුදුසුකමක්

සමග

අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර හයක පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක්

(2) රජයේ දිප ව්‍යාප්ත සේවාවේ III/ II පංතියේ නිලධාරියෙකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තනතුරක නිලධාරියෙකු වීම.

සමග

III/ II පංතියේ තනතුරක අවම වශයෙන් වසර හයක පළපුරුද්ද.

**2. ව්‍යාපෘති ලේකම් (PS6)**

**අවම සුදුසුකම් හා පළපුරුද්ද පහත (1) හෝ (2)**

(1) ඉංග්‍රීසි සහ සිංහල/ දෙමළ භාෂාව ඇතුලුව සම්මාන තුනක් (3) සහිතව විෂයයන් හයකින් (6) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වී තිබීම.

සමග

පිළිගත් ආයතනයක ලේකම් පාඨමාලාවක් හෝ වරලත් ලේකම් විභාගය සඳහා අධ්‍යාපනය හැදෑරීම

සමග

අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්ද

(2) අදාළ ක්ෂේත්‍රයේ වසර 02 පළපුරුද්ද සහිත වරලත් ලේකම්වරයෙකු වීම.

**3 කළමනාකරණ සහායක / ප්‍රසම්පාදන සහායක**

**අවම සුදුසුකම් හා පළපුරුද්ද**

අ.පො.ස. (උ/ පෙළ) විභාගයේ විෂයයන් තුනකින් (03) සමත්වීම සහ සිංහල/ දෙමළ, ගණිතය සහ ඉංග්‍රීසි ඇතුළුව සම්මාන හතරක් සහිතව එක්වර අ.පො.ස. (සා/ පෙළ) විභාගයේ විෂයන් හයකින් (06) සමත් වී තිබීම.

- විදේශ අරමුදලින් ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක වසර දෙකක (02) සේවා පළපුරුද්දක් තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**පොදු කොන්දේසි**

1. එක් එක් අයදුම්කරු අයදුම්පත් කැඳවනු ලබන දිනයේ හෝ ඊට පෙර තනතුරට අදාළ සුදුසුකම් සපුරා තිබීම අනිවාර්ය වේ.
2. වයස් සීමාව : වයස අවුරුදු 64 ට අඩුවිය යුතුය.
3. වැටුප : අංක 01/2019 දරන 2019.03.05 දිනැති චක්‍රලේඛය පරිදි හෝ අංක 02/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා එහි සංශෝධනවල සඳහන් පරිදි වැටුප් හා අනෙකුත් දීමනා හිමිවේ.
4. සේවා කොන්දේසි

   වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත පත්කරනු ලැබේ. කාර්ය සාධනය හා සේවා අවශ්‍යතාවන් සලකා බලමින් උපරිමය වසර දෙකක් සඳහා වාර්ෂිකව සේවා දීර්ඝ කිරීම සලකා බලනු ලැබේ.
5. අනෙකුත් ප්‍රතිලාභ

   සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවකයා විසින් 8% ක දායකත්වයක් ලබාදිය යුතු අතර, සේවා යෝජක විසින් සේවක අර්ථසාධක අරමුදල සඳහා 12% ක සහ සේවක භාරකාර අරමුදල සඳහා 3% ක දායකත්වයක් ලබාදෙනු ලැබේ.
6. කුලියාපිටියේ ව්‍යාපෘති කාර්යාලය පිහිටා ඇති ස්ථානය

   සුදුසුකම්, පළපුරුද්ද සහ අනෙකුත් අදාළ විස්තර පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන ලද තමා විසින්ම පිළියෙල කරගත් අයදුම්පත ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් සඳහන් කර 2020.07.13 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි ව්‍යාපෘති අධ්‍යක්ෂ, වයඹ විශ්වවිද්‍යාල නගර ප්‍රදේශ සංවර්ධන ව්‍යාපෘතිය, අංක 7/88, ජයන්ති මාවත, කුලියාපිටිය යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් එවීමට හෝ අතින් ගෙනැවිත් භාරදීටම හැකිය. අයදුම්පත බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ**
**වයඹ විශ්වවිද්‍යාල නගර ප්‍රදේශ සංවර්ධන ව්‍යාපෘතිය,**
**උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය.**
**2020.06.22**